කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

# පෙරදිග සංගීතය - I

11 ශ්‍රේණිය

කාලය පැය 01 යි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි හා වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඔබට ලැබෙන පිළිතුරු පත්‍රයෙහි පැහැදිලිව (×) ලකුණු කරන්න.

01) සප්තකය තුළ සියලු ස්වර ගණන කීයද ?

i. 7
ii. 8
iii. 12
iv. 13

02) "ස්වරමාලිකා" යනු රාගධාරී සංගීතයේදී හඳුන්වන්නේ කුමක්ද ?

i. ඛයාල් ගී
ii. සංගති
iii. ආලාප
iv. සර්ගම්

03) සර්ව කෝමල රාගයක් වනුයේ

i. කාෆි
ii. ඛමාජ්
iii. භෛරවි
iv. භෛරව

04) රාගයක යෙදෙන ප්‍රබලම ස්වරය වනුයේ,

i. වාදී ස්වරය
ii. විවාදී ස්වරය
iii. වර්ජ ස්වරය
iv. අනුවාදී ස්වරය

05) බිලාවල් රාගයට අයත් ස්වර ඛණ්ඩයකි

i. ග රි ස ධ̣ ස
ii. ග රි ග ප ම ග
iii. ස ග ම ප ධ
iv. ස̇ නි ධ ප ම

06) ස̇ නි ධ ප / ම ප ග ම / ප - ග ම / ග රි ස - / ස්වර පාදය අයත් වන ගී පාදය

i. කාෆිමේලගත රිධ හැරයන
ii. මා ස්වර වාදී සා සංවාදී
iii. දිනයෙහි තෙවන සමයෙහි ප්‍රගැයෙන
iv. රාගය හිමපලාසී රසදේ

07) යමන් රාග ආශ්‍රිත ගීතවලින් වඩාත් මතුවන්නේ

i. බියගුලු රසයයි
ii. කරුණා රසයයි
iii. ශෘංගාර රසයයි
iv. හාස්‍ය රසයයි

08) මධ්‍යම රාත්‍රියෙහි ගායනයට ඉතාම සුදුසු වූ රාගයකි

i. කාෆි රාගය
ii. ඛමාජ් රාගය
iii. භෛරව රාගය
iv. භූපාලි රාගය

09) "සසෙසි රුසිරු පෙම් මුසුකොට...." ගී පාදය අයත්වනුයේ,

i භූපාලි මධ්‍යලය ගීයකි
ii. බිලාවල් මධ්‍යලය ගීයකි
iii. භූපාලි ස්ථාපන ගීයකි
iv. බිලාවල් ස්ථාපන ගීයකි

10) "සපට්තාන" යන්නට සමාන තාන නාමයකි.

i. ස්වරක්ෂරතාන
ii. බෝල්තාන
iii. සරලතාන
iv. මිශ්‍රතාන

11) විවිධ තානවර්ග යොදා කල සරලගීත නිර්මාණයකි

i. දන්නෝ බුදුන්ගේ
ii. රත්නදීප ජන්ම භූමි
iii. බැස සීතල ගඟුලේ
iv. ගෝපළු වනපෙත

12) "සුළු තනිතිත" ට සමාන බව දනවන හින්දුස්තානි තාල පදයකි

i. කෙහෙර්වා
ii. ලාවණී
iii. කදප් තාලය
iv. ඩෙම්ටෝ

13) "දිකුංතාකුදොං" යන පදය වැයීමට සුදුසුම භාණ්ඩය නම්

i. තබ්ලාව
ii. මද්දලය
iii. ඩොල්කිය
iv. දවුල

14) දීප්චන්දි තාලයට සමාන වූ තිත හඳුන්වන්නේ


i. මහතිත
ii. මැදුම් තිත
iii. සුළුමහ දෙතිත
iv. මැදුම් මහ දෙතිත

15) මැදුම්මහ දෙතිතට සමාන මද්දල පද නාමයකි

i. පසන්
ii. තිර්ලානා
iii. තංගපාට
iv. කීර්තනම්

16) 'Soprano' හඬතලය හිමි සංගීත භාණ්ඩය

i. සිතාරය
ii. වයලීනය
iii. වියෝලාව
iv. ගිටාරය

17)  බටහිර සංගීත ස්වරයන්හි එකතුවෙහි වටිනාකම,

i. කොවර්මාත්‍රා 2කි
ii. කොවර්මාත්‍රා 5 කි
iii. මිනිම් මාත්‍රා 2 කි
iv. මිනිම් මාත්‍රා 5 කි

18) සුෂිර වාද්‍යභාණ්ඩ යුගලකි.

i. කොම්බුව-පන්තේරුව　　iii. බටනලාව-සංඛය

ii. බටනලාව-තාලම්පට　　iv. සංඛය-වීණාව

19) "සායිසාජ්" පිහිටි සංගීත භාණ්ඩය

i. වයලීනය　　iii. තාම්පූරාව

ii. සිතාරය　　iv. මැණ්ඩලීනය

20) ඔස්තාද් ශකීර් හුසේන් ශිල්පීය ප්‍රගුණත්වය ලැබුයේ

i. සන්තූරය　　iii. තබ්ලාව

ii. බටනලාව　　iv. වයලීනය

21) පහත සඳහන් වගුව ආශ්‍රිතව 21-28 දක්වා පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| A. සඳවා සුදු වැලි | A. මුදු පතුල | A. සැඳෑ අඳුර | A. සුවඳපත්ම |
| B. පැහැසරණිය | B. අන්නබලන් සඳ | B. සාධු ධංහඩා | B. අද වෙස්සන්තර |
| C. චන්ද්‍ර නන්දන | C. අතට වලලුද | C. ගුමු ගුමුව | C. අඹදඹ නාරන් |
| D. තුරු රත්න | D. තැන්තැන්වලම ලැගි | D. එන්න මද නලේ | D. දන්නෝබුදුන්ගේ |
| E. ..................... | E. ..................... | E. ..................... | E. ..................... |

21) A බණ්ඩයට අයත්වන ගී වර්ගය

i. ගැමි ගී　　iii. නූර්ති ගී

ii. සේ ගී　　iv. සරල ගී

22) B බණ්ඩයේ ............ යට සුදුසු ගීතයකි.

i. හනිකවරෙව් කොල්ලනේ　　iii. යමුණා ගංතෙර ......

ii. දිනිඳු අවරේ .........　　iv. රුක් අත්තන මල මුදුනේ.........

23) C බණ්ඩයේ හිම්පලාසි රාග ආශ්‍රිත ගීතය වනුයේ,

i. A　　iii. C

ii. B　　iv. D

24) D බණ්ඩයේ D අයත් අයත් ගීතය ඇතුලත් වනුයේ,

i. හේමමාලි නූර්තිය　　iii. වෙස්සන්තර නූර්තිය

ii. සිරිසඟබෝ නූර්තිය　　iv. ශකුන්තලා නූර්තිය

25) A බණ්ඩයෙහි ගී වර්ගයට ඇතුලත් කලහැකි ගී වර්ගයකි.

i. සරල ගී　　iii. වන්නම් ගී

ii. නාඩගම් ගී　　iv. තුන්සරණේ ගී

113

26) අනාඝාතාත්මක සේ ගීයක් අඩංගුව ඇත්තේ

i. A
ii. B
iii. C
iv. D

27) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ ගී පැබඳුම් 2 කි.

i. B-C , D
ii. C – b, c
iii. B – A , b
iv. D – b , c

28) ''කලිඳු ගංගා දෙණියේ වනතීරේ.......'' ගීතය ඇතුලත් කළ හැකි ඛණ්ඩය කුමක්ද ?

i. A
ii. B
iii. C
iv. D

29) ''කොබෝ කුරුළු වනේ ..........'' ගී පදයෙහි යතියට හිමි මාත්‍රා ගණන වනුයේ

i. 3 කි
ii. 5 කි
iii. 4 කි
iv. 6 කි

30) සඳැස් හා ගී මත් සම වන ගී පාදයකි.

i. ප්‍රේමයෙන් මන රංජිත වේ නාදිකවේ
ii. මිහිකත නලවාලා
iii. ඇතුලට වැදගෙය ඇවිලෙන ගින්නේ
iv. සසර වසන තුරු

31) සිංහල නිර්මාණ සංගීතයෙහි පියානන් ලෙස හැඳින්වෙන්නේ,

i. සුනිල් ශාන්ත මහතා
ii. කරුණාරත්න අබේසේකර මහතා
iii. ආනන්ද සමරකෝන් මහතා
iv. මොහොමඩ් ගවුස් මහතා

32) ''රිදී වලාව'' ''ගුවන් තොටිල්ල'' ''ගංගා ගීතය'' නිර්මාණ කරුවාවූයේ,

i. ඩබ්.ඩී. මකුලොලුව මහතා
ii. සුනිල් ආරියරත්න මහතා
iii. සරත් විමලවීර මහතා
iv. සුනිල් ශාන්ත මහතා

33) කෝලම් රංග සම්ප්‍රදායට අයත් වූ ගී පාදයකි

i. ඉන්නරතා තැබුනම මට ... ජේඩ් වීදානේ සක්නට
ii. ගෙයි පාන නෑ ගියෝතින් .... මම අන්ධකාරෙ ඉන්නම්.
iii. රජිඳානෝ රම්‍ය මැන්කරේ හි ..... පොපැයින් නම් නිරිඳුගේ....
iv. අතට වලලු ද .... පයට ගිගිරිද ....

34) වේග රිද්ම ගායනා ශෛලියකදී වයලීනයට මේ නම උපයෝගී කරගනී.

i. වියෝලාව
ii. බැන්ජෝ
iii. රවිකිඤ්ඤය
iv. මැන්ඩලාව

114

35) සම්ප්‍රදායික නාඩගම් තනුවල ඡායාව ඇතිව නිර්මාණය වූ නාට්‍යයකි.

i. මනමේ
ii. කාලගෝල
iii. රතුහැට්ටකාරි
iv. නරිබෑනා

36) බටහිර සංගීත අනුව Percussion (සමාඝාත) භාණ්ඩයකි.

i. ගිටාරය
ii. ජලතරංගය
iii. චෙලෝව
iv. බටනලාව

37) ග්‍රැමෆෝන් ගීත අතර හින්දිතනු යුගයට අයත් ගීතයකි

i. දැඩිකල මාතා
ii. මහබෝධි මුලේ
iii. සීතාමාසිරියා ඉන්නේ
iv. හරිමි රජ සැපා....

38) නාදයේ අඩුවැඩිබව නැතහොත් හඬේසැර හඳුන්වනුයේ

i. විපුලතාව
ii. තාරතාව
iii. ධ්වනි ගුණය
iv. ආතතිය

39) නාද තරංගයකදී රටාවේ එකිනෙකට වෙනස්කම් ඇතිවනුයේ

i. රූපභේදය නිසාය
ii. ධ්වනි ගුණය නිසාය
iii. තාරතාවය නිසාය
iv. විපුලතාව නිසාය

40) විවිධ සංගීත කොටස් ශබ්ද පරිගණකය තුලට ගෙන නැවත පිටකරන උපකරණය හඳුන්වන්නේ

i. CD Rom
ii. Microphone
iii. Speaker
iv. Sound Card

e තක්සලාව The National e-learning Portal for The General Education

115

## 2 - කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

01)

i. පෙරදිග සංගීතය වශයෙන් අප හඳුනාගනු ලබන සංගීතයට මුල් වූ සංගීත පද්ධතිය කුමක්ද ?

ii. ලෙහෙරා වාදනය කෙරෙන්නේ කුමක් සඳහාද ?

iii. "රත්නදීප ජන්ම භූමී" ගීතයේ තාලය නිවැරදිව ප්‍රස්තාර කරන්න.

iv. වයලීනය සුශරකරන පෙරදිග ශෛලීන් 2 ක් ලියන්න.

v. කරුණාව සමග ...... හොඳහිත පතුරන්න ........ , ගීතයේ ගායන ශිල්පිණිය නම් කරන්න.

vi. 'තානායම් පොළ' භාවිතවන රංග ශෛලිය කුමක්ද ?

vii. "තුරු රත්න සිරි ලෙසිනා" ..... ගී පාදය අයත්වනුයේ,

viii. බැලසන්ත නාඩගමට අයත් ගී පාදයකි

ix. දෙපානෝ නාට්‍යයේ ගී පාදයකි

x. Time Signature

Key Signature උදාහරණ දක්වන්න.

xi. රන්මලක් ලෙස දෙව්බඹුන් ....... ගී පාදයට හිමි තාලය කුමක්ද ?

xii. ස , ග , ප, යන ස්වරයන්ට හිමි ස්වර සංඛ්‍යාත දක්වන්න.

02)

i. භූපාලි රාග විස්තර දක්වන්න.

ii. භීම්පලාසි රාගයට හිමි සර්ගම් ස්ථායි කොටස ප්‍රස්තාර කරන්න.

iii. කාෆි රාගයට අදාලව මධ්‍යලය ගීයට තාන 3 ක් ප්‍රස්තාර කරන්න.

03)

i. සම්ප්‍රදායික ජන ගී වර්ගීකරණය දක්වන්න.

ii. වන්නම්/හෝ ප්‍රශස්ති පිළිබඳ කෙටි සටහන් ලියා උදා:- දක්වන්න.

04) සිතාරය/එස්රාජය/තබ්ලාව යන සංගීත භාණ්ඩවලින් 1 ක් තෝරා,

i. රූප සටහන ඇඳ කොටස් නම් කරන්න

ii. එහි නිර්මාතෘ සඳහන් කරන්න.

iii. ප්‍රචලිත ශිල්පීන් නම් කරන්න.

iv. සිතාරය/එස්රාජය/ සුශරකිරීම් දක්වන්න. (තබ්ලාවට/ අයත් ශිල්පීය අංග 4 ක් ලියන්න.)

05) නූර්ති / නාඩගම්

i. විශේෂිත සංගීත පද්ධතීන් නම් කරන්න.

ii. ලක්ෂණ 2 බැගින් ලියන්න.

iii. ආවේණික සංගීත ශිල්පීන් නම් කරන්න.

iv. ගීතය බැගින් ලියා දක්වන්න.

06)

i. බටහිර සංගීතයේ ප්‍රධාන සංඛේත වලට අයත් Rest Marks නම්කර Stave මත නිවැරදිව දක්වන්න.

ii. Harmony යන සිද්ධාන්තය කෙටියෙන් පැහැදිලි කරන්න.

07)

i. ග ම ප / ග ම රි / ස රි ග / රි ස ස / මධ්‍යම හා පංචම භාවයෙන් ලියන්න.

ii. අපරදිග සංගීතයේ හඬතල කීයද ? ඒ මොනවාද ?

iii. ගිටාරය / එකෝඩියන් පිළිබඳ කෙටි සටහක් ලියන්න.

08)

i. නාදයේ ත්‍රිවිධගුණ කෙටියෙන් දක්වන්න.

ii. ''ගිලෙමී ඔබේ ගුණ මුදේ'' ගී පාදයට හිමි තාලය අනුව ප්‍රස්ථාරගත කරන්න.

iii. කපිරිඤ්ඤා සංගීතය පිළිබඳ වැදගත් කරුණු 3 ක් ලියන්න.

The National e-learning Portal for The General Education